**ආරක්ෂක සේවා අණ හා මාණ්ඩලික විද්‍යාලය - 2023**

**------------------------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ආරක්ෂක සේවා අණ හා මාණ්ඩලික විද්‍යාලයේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරුද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.
මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර මාණ්ඩලික විද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, මාණ්ඩලික විද්‍යාලය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය මාණ්ඩලික විද්‍යාලය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා මාණ්ඩලික විද්‍යාලයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

මාණ්ඩලික විද්‍යාලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරික්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, මාණ්ඩලික විද්‍යාලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් , චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද ,අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය , ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් මාණ්ඩලික විද්‍යාලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ මාණ්ඩලික විද්‍යාලයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ මාණ්ඩලික විද්‍යාලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, මාණ්ඩලික විද්‍යාලය ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

**1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ**

**1.5.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම**

| අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 01 හි 48 වන ඡේදය අනුව ආදායම් හා වියදම් හිලව් නොකල යුතු වුවද , රු.151,847,248 ක් වූ පාඨමාලා ගාස්තු ආදායමින් රු.21,318,750 ක් වූ විදේශ සංචාර වියදම් හිලව් කර රු.130,528,497 ක් පමණක් ආදායම් වශයෙන් ගිණුම්ගත කර තිබුණි. | විදේශ පාඨමාලා ගාස්තු ආදායම රු.130,528,497කි. රු.21,318,750 ක මුදල විදේශ සංචාරයට අදාල ශිෂ්‍ය නිලධාරීන් හට අයත් මුදලක් වේ. එය ආදායමක් නොවන අතර විදේශීය ශිෂ්‍ය නිලධාරින් සඳහා විදේශ සංචාරයට සහභාගී වීම වෙනුවෙන් ගෙවිය යුතු මුදලක් වේ. විදේශ සංචාරයට අදාල ලැබීම් හා ගෙවීම් වෙනත් ආදායම් ගිණුමට හර/බැර කර ඇත. අවසාන ප්‍රතිඵලය ශූන්‍ය වන අතර වෙනත් ආදායම් ගිණුමේ ශේෂයට ඉන් කිසිදු බලපෑමක් සිදුවී නොමැත. ඉදිරියේදී විදේශ සංචාරය සඳහා ලැබෙන මුදල හා ගෙවීම වෙනම ගිණුමක ගිණුම්ගත කිරීමට කටයුතු කරනු ලැබේ. | ගිණුම්කරණ ප්‍රමිති අනුව ගිණුම් තැබිය යුතුවීම. |

**1.5.2 ගිණුම්කරණ අඩුපාඩු**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ)2023 වර්ෂයට අදාළ රු.1,439,784 ක් උපචිත නඩත්තු වියදම් සඳහා ප්‍රතිපාදන ගිණුම්වල සලසා නොතිබීම හේතුවෙන් , 2023 වර්ෂයේ අතිරික්තය එම වටිනකමින් වැඩියෙන් දක්වා තිබුණි. | මෙම නඩත්තු වියදම් පුස්තකාල ගොඩනැගිල්ලේ ජල කාන්දුව නවීකරණය කිරීමට අදාල රැඳවුම් මුදලින් ගෙවිය යුතු වියදම් වන බැවින් උපචිත වියදම් වල ඇතුලත් නොකරන ලදී. ඉදිරියේදී රැඳවුම් මුදලින් ගෙවිය යුතු වියදම් රැඳවුම් මුදලින් අඩු කර උපචිත වියදම් වල ගැලපීමට කටයුතු කරනු ලැබේ. | වර්ෂයට අදාල උපචිත වියදම් හඳුනාගෙන ගිණුම්ගත කල යුතු වීම. |
| (ආ)මාණ්ඩලික විද්‍යාලයේ රු.2,982,560 ක් වූ ටෝනර් හා කාට්‍රිජ් තොගය අවසන් තොගයෙන් අත්හැරී තිබුණු අතර රු. 1,377,165 කින් ලිපිද්‍රව්‍ය තොගය වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි. ඒ හේතුවෙන් වර්ෂයේ අවසන් තොගය රු.1,605,395 කින් අඩුවෙන් දක්වා තිබීම මත අතිරික්තය එම වටිනාකමින් අඩුවෙන් දක්වා තිබුණි. | ලිපි ද්‍රව්‍ය අවසාන තොගය ගණනය කිරීම ස්වාධීන මණ්ඩලයක් මඟින් සිදු කරන අතර එහිදී සිදු වූ ප්‍රමාද දෝෂයක් හේතුවෙන් ලිපි ද්‍රව්‍ය අවසාන තොගයේ වෙනසක් සිදුව ඇත. විගණන නිරීක්ෂණයෙන් පෙන්වා දී ඇති පරිදි ලිපි ද්‍රව්‍ය තොගයෙහි පවතින වෙනස ජ'නල් සටහන් යොදා 2024 වර්ෂය තුලදී නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ. | තොග ගණනය කිරීම හා ගිණුම්ගත කිරීම නිවැරදිව කල යුතු වීම. |

### 1.5.3 අනුචිත ඇගයීම හෝ ඇස්තමේන්තු කිරීම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේදී පිරිවැය රු.223,585,636 ක් වූ වත්කම් වල ධාරණ අගය ශුන්‍ය වී තිබුණ ද අදාළ වත්කම් විද්‍යාලය විසින් භාවිතයට ගෙන තිබුණි.එහෙත් එම වත්කම් අගය කර ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි. | වත්කමෙහි ධාරණ අගය ශුන්‍ය වූ වත්කම් හදුනාගෙන ප්‍රත්‍යාගණනය කිරීමට ඉදිරියේදී කටයුතු කරනු ලැබේ. | නිවැරදි වත්කම් වටිනාකම මූල්‍ය ප්‍රකාශන තුළ හෙළිදරව් කිරීමට කටයුතු කල යුතු වීම. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 117,304,421 ක් වූ අතර ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු. 86,736,631 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 30,567,790 ක වර්ධනයක් නිරීක්ෂණය විය. ඉකුත් වර්ෂයට සාපේක්ෂ මෙහෙයුම් වියදම් රු.12,808,187 කින් වැඩිවීම ඉක්මවා භාණ්ඩාගාරයෙන් අක්මුදල් ලැබීම් රු.26,368,377 කින් වර්ධනය වීම මෙන්ම විදේශ විනිමය හුවමාරු ගිණුමේ අවාසිය රු.49,764,778 කින් වැඩිවීම ඉක්මවා විදේශ ශිෂ්‍යන්ගෙන් ලද ආදායම රු. 57,548,497 කින් වැඩි වීම මෙම වර්ධනය සඳහා ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 වෙනත් සංවිධානවල සම්පත් උපයෝජනය කිරීම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| හෙයියන්තුඩුව තරුණ සේවා සභාවට අයත් අක්කර 11 ක ඉඩම භාවිතයට ගනිමින් පැවති අතර ඉඩමෙහි නීත්‍යානුකූල අයිතිය ප්‍රවර්තන වර්ෂයේ දෙසැම්බර් 31 වන විටත් පවරාගෙන නොතිබුණි. තවද ප්‍රවර්තන වර්ෂයේ අවසානයට මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබූ රු. 1,263,734,910 ක් වූ ශුද්ධ ගොඩනැගිලි වටිනාකම තුල එම ඉඩමේ පිහිටි ගොඩනැගිලි වටිනාකමද ඇතුලත්ව තිබූ නමුත් එය වෙන්ව ගණනය කර නොතිබුණි. | ජාතික තරුණ සේවා සභාවට අයත්ව තිබූ හෙයියන්තුඩුව වත්ත ඉඩමෙන් අක්කර 11යි රූඩ් 0 යි පර්චස් 10 ක භූමි ප්‍රමාණය මුදල් ගෙවීමකින් තොරව ආරක්ෂක අමාත්‍යාංශයේ භුක්තියට පවරා දීමට සුදුසු බැව් MOD/DEF/DSCSC/ADM 2023 හා 9 ශ අමාත්‍යාං දිනැති ආරක්ෂක 13 ඔක්තෝම්බර් මස .ලය වෙත දන්වා ඇතලිපිය මගින් මෙම විද්‍යා 50/ගම්/දෙ/6/15හා 12 ජනවාරි 2024 දිනැති ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිසන් සභා ලිපිය මහින් මුදල් අය කිරීමකින් තොරව පුද්ගලයන් සතු ඉඩම් ලබා දීමට නොහැකි බැව් දන්වා ඇත. විද්‍යාලීය නියෝජිතයින් සහ ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ නියෝජිතයන් සමඟ සාකච්ඡාවක් පවත්වා එහි වාර්තාවක් ආරක්ෂක කවුන්සලය වෙත දැනුම් දීමට කටයුතු කරන බව දන්වා ඇත. | ඉඩමේ නීත්‍යානුකූල අයිතිය පවරා ගත යුතුවීම |